**ශීර්ෂය 112 - විදේශ කටයුතු අමාත්‍යාංශය -2023**
**-----------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

ශීර්ෂය 112 - විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට විදේශ කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **7002-0-0-35-13 දරන අග්‍රිම ගිණුම** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු. 50,970,216 ක් වූ අතර එය 2013 හා ඊට පෙර වර්ෂවලට අදාළ නොපියවූ අත්තිකාරම්වලින් සමන්විත වී තිබුණි.මෙම ශේෂය තුළ විදේශ දූත මණ්ඩල සේවය සඳහා විදේශගත වූ කාර්ය මණ්ඩලයට ලබාදෙන ලද භාවිතයට නොගන්නා නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු 103 කට අදාළ රු.32,474,452 ක් හා අතුරු අග්‍රිම රු.18,495,764 ක් පැවතුණි. | විගණන කළමණාකරන කමිටු රැස්වීම් වලදී සාකච්ඡා කිරීමෙන් පසුව මෙම ශේෂ නිරවුල් කිරීමට අදාළ නිර්දේශ ලබා දීම සඳහා අමාත්‍යාංශය අභ්‍යන්තරිකව කමිටු පත් කරන ලදී. ඒ අනුව පෙන්වා දී ඇති ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | නොපියවූ අත්තිකාරම් කඩිනමින් නිරවුල් කළ යුතුය. |
| (ii) | භාවිතා නොකරන නිවාස සඳහා තබා ඇති ආරක්ෂිත තැන්පතු වටිනාකමින් රු.3,602,632 ක් වර්ෂ 20 ඉක්මවා තිබුණු අතර රු.28,871,820 ක් වර්ෂ 10 ත් 20 ත් අතර කාලපාරාසයකට අයත්ව තිබුණි. එම තැන්පතු අයකර ගැනීම සම්බන්ධයෙන් 2009 සැප්තැම්බර් 01 දිනැති හා අංක 250 දරන අමාත්‍යාංශ අභ්‍යන්තර චක්‍රලේඛය මගින් උපදෙස් ලබා දී තිබුණද ඒ අනුව එම තැන්පතු මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | භාවිතා නොකරන නිවාස සඳහා තබා ඇති ආරක්ෂිත තැන්පතු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | ෆ්‍රැන්ක්ෆර්ට් දූත මණ්ඩලය වසා දමා තිබුණද නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු රු.2,234,933 ක් නිරවුල් කර නොතිබුණි. | -එම- | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 371 ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය නිම කළ වහාම පියවිය යුතු නමුත් ඒ අනුව කටයුතු | -එම- | තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොකිරීම හේතුවෙන් අවස්ථා 69කදී ලබාදී තිබුණු නොපියවූ තත්කාර්ය අතුරු අග්‍රිම රු.18,495,764 ක ශේෂයක් අග්‍රිම ගිණුම තුළ පැවතුණි. මෙම තත්කාර්ය අතුරු අග්‍රිම ශේෂය තුළ රු.1,585,560 ක් වර්ෂ 20 ක් ඉක්මවා තිබුණු අතර රු.16,910,769 ක් වර්ෂ 10 ක සිට වර්ෂ 20ක් දක්වා අතර කාල පරාසයකට අයත්ව තිබුණි. | | |
| **(ආ)** | **7002-0-0-35-23 අග්‍රිම ගිණුම** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.959,519,202 ක් වූ අග්‍රිම ගිණුම් ශේෂය තුළ රු.56,629,614 ක් දූත මණ්ඩල කාර්යය මණ්ඩල පදිංචි වී නොමැති නිවාස සඳහා තබා තිබුණු තැන්පතු 134 කට අදාළ වී තිබුණි. එම වටිනාකමින් රු.2,486,516ක් වර්ෂ 20 ක් හා රු.10,177,716 ක් වර්ෂ 10 ක් ඉක්ම වූ තැන්පතු වටිනාකම් වී තිබූ අතර රු.27,754,083 ක් වර්ෂ 05 ක සිට වර්ෂ 10 ක් අතර කාල පරාසයකට අයත්ව තිබුණි. | පදිංචි නොමැති නිවාසවලට තබන ලද ආරක්ෂිත තැන්පතු අයකිරීමට අදාළව අඛණ්ඩව කටයුතු කරන අතර 2023 වර්ෂයේ රු.3,460,277 අයකර ඇත. ඉතිරි රු.56,629,614 පියවීම් කටයුතු අඛණ්ඩව සිදුකරනු ලැබේ. | නොපියවූ අග්‍රිම පියවීමට කටයුතු කළ යුතු අතර විදේශ දූත මණ්ඩල නිලධාරීන්ගේ සේවය අවසන් වන අවස්ථාවේදී නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු අය කර ගැනීම කළ යුතුය. |
| (ii) | වසා දමන ලද දූත මණ්ඩල තුනකට අදාළ නිවාස සඳහා තබන ලද ආරක්ෂිත තැන්පතු රු.9,199,873 ක් නිරවුල් කර නොතිබුණි. | මෙම දූත මණ්ඩල වසා දැමීමේ තීරණ කඩිනමින් ගැනීමත් සමඟ, අදාළ නිවාස කුලී ගිවිසුම් කාලය සම්පූර්ණ වීමට පෙර ඉවත් වීමට සිදුවීම නිලධාරීන්ගේ පාලනයෙන් බැහැරව සිදුවූවක් ලෙසත්,භෞතිකව අදාළ රටෙහි ක්‍රියාකාරිත්වයක් නොමැති බැවින් මෙම ශේෂ අයකර ගැනීමට සෘජුව මැදිහත්වීමේ දුෂ්කරතා පැන නැඟී ඇත. කෙසේ වෙතත් මෙම ශේෂ පිළිබඳව ද නිර්දේශ ලබාදීමට පත්කරන ලද කමිටුව වෙත යොමු කර ඇත. | කඩිනමින් තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) | නිවාස කුලී ගෙවීම්වලට අදාළ 1967 පෙබරවාරි 26 දිනැති අංක X – 301 දරන අමාත්‍යාංශ චක්‍රලේඛ විධිවිධාන අනුව විදේශ දූත මණ්ඩලවල සේවය සඳහා විදේශ ගත වූ කාර්යය මණ්ඩලයට ලබා දෙන ලද ආරක්ෂිත තැන්පතු/ කුලී අත්තිකාරම් මුදල් සඳහා අදාළ නිලධාරියා පෞද්ගලිකවම වගකිවයුතු බව දක්වා තිබුණි. එසේ වුවද | නව නිවාස කුලියට ගැනීම වෙනුවට පෙර නිලධාරීන් භාවිතා කල නිවාසම භාවිතා කිරීම ප්‍රායෝගිකව සිදුවේ. මේ නිසා අයකිරීමක් සිදුකිරීමට නිශ්චිත පුද්ගලයෙකු තීරණය කිරීමට නොහැකි බැවින් ඉතා දීර්ඝ කාලයක සිට පැවත එන තොරතුරු සොයාගැනීමට අපහසු ශේෂයන් පත් කරන ලද කමිටුව | වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අයකර ගැනීමට ක්‍රමවේදයක් පිළියෙළ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිවාස සඳහා සිදු වී තිබුණු අලාභ හානි හේතුවෙන් නිවාස හිමියන් විසින් ආපසු නොගෙවන ලද අත්තිකාරම් මුදල් වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග නොගෙන රු.6,009,786ක් රජයේ වියදම් සේ කපා හැර තිබුණි. | විසින් අධ්‍යයනය කර ලබාදුන් නිර්දේශ මත ක්‍රියාමාර්ග ගැනීම සිදුකර ඇත. | |
| (iv) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 371 ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය නිම කළ වහාම පියවිය යුතු නමුත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් දූත මණ්ඩලවල නොපියවූ අත්තිකාරම් තුළ රු.5,619,509 ක තත්කාර්යය අතුරු අග්‍රිම පැවතුණි. මෙම වටිනාකම තුළ වර්ෂ 10 ඉක්මවූ අතුරු අග්‍රිම රු.446,388 ක්ද වර්ෂ 05 ඉක්මවූ අතුරු අග්‍රිම රු.1,724,058ක්ද විය. | විදේශ දූත මණ්ඩලවලට අදාළ තත්කාර්ය අතුරු අග්‍රිම රු.5,619,509 සම්බන්ධයෙන් උපලේඛනයක් ඉදිරිපත් කර ඇත. | තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**2.2 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවද, මූලධන වැය විෂයන් 08 ක රු.153,106,068ක් හා පුනරාවර්තන වැය විෂයන් 04 ක රු.45,575,069 ක් ලෙස සියයට 58 ක සිට සියයට 99ක් දක්වා පරාසයකින් ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | අයවැය චක්‍රලේඛ අංක 01/2023 හා 02/2023 මඟින් දැනුම්දී තිබූ පරිදි ඇස්තමේන්තු කර ප්‍රතිපාදන සලසා තිබුණද උපරිම ආකාරයෙන් වියදම් අඩු කිරීම හා 2022 ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවට වඩා 2023 වියදම් දැරීම සිදුවූ කාලය තුළ විනිමය අනුපාතයේ සිදුවූ වාසිදායක තත්ත්වය නිසා ප්‍රතිපාදනයන්හි ඉතිරිවීම් වාර්තා වී ඇත. | ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කළ යුතුය. |

### 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1.2 වගන්තිය | | | |
| | | (i) ආයතන සංග්‍රහය අනුව පත්කිරීමක් හෝ උසස් කිරීමක් කළ හැක්කේ අනුමත සේවක සංඛ්‍යාවේ තනතුරකට පමණි. එසේ වුවද, විදේශ සේවයේ අනුමත අධ්‍යක්ෂ ජනරාල් තනතුරු සංඛ්‍යාව 09 ක් වුවද, වැඩ බැලීම සඳහා පත්කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරු 08 දෙනෙක් ඇතුළුව තථ්‍ය ප්‍රමාණය 17 ක් විය. තවද වැඩබලන අතිරේක ලේකම්වරු 05 දෙනෙකු පත්කිරීම සඳහා පත්කිරීම් බලධාරියාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අදාළ පත්කිරීම් ස්ථාපිත කර ගැනීමේ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී. අමාත්‍යාංශයේ කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට විදේශ සේවයේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතම නිලධාරීන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව වැඩ බැලීමේ පදනම මත පත් කිරීමට විදේශ කටයුතු ලේකම් විසින් කටයුතු කරන ලදි. | වැඩබැලීම සඳහා පත් කිරීම් කිරීමේදී ආයතන සංග්‍රහය හා කාර්ය පරිපාටික රීති සංග්‍රහය අනුගමනය කළ යුතුය. |
| | | (ii) කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 136 වගන්තිය අනුව කිසියම් තනතුරකට නිල වශයෙන් හිමි දීමනා හා වරප්‍රසාද එම තනතුරෙහි වැඩ බලන හෝ රාජකාරී ඉටුකරන නිලධරයාට එම වැඩ බලන හෝ රාජකාරී ඉටු කරන හෝ කාලය තුළදී භුක්ති විදිය හැකි වුවත් අනුමත තනතුර හා පත් කිරීම් බලධරයාගේ අනුමැතිය නොමැතිව පත්කරන | මෙම පත් කිරීම් ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිල වාහන සහ ඉන්ධන දීමනා හිමි තනතුරු බැවින් එම නිලධාරීන් සඳහා නිල වාහන සහ ඉන්ධන දීමනා ගෙවීම් කිරීම සිදු කළ යුතු බව සටහන් කරමි. | නිල වශයෙන් හිමි නොවන දීමනා නොගෙවිය යුතු අතර එසේ ගෙවූ මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ලද වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරු 08 දෙනෙකු වෙනුවෙන් නිල වාහන වෙන් කර තිබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.3,650,191ක් ඉන්ධන දීමනා වශයෙන් ගෙවා තිබුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 156(i) (අ) | සේවයෙන් ඉවත්ව ගොස් සිටි නිලධාරිනියකට වැටුප් වශයෙන් රු.558,471ක් වැඩිපුර ගෙවීම් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පරිපාලනමය ක්‍රියාමාර්ග සියල්ල ගෙන ඇති බැවින් නීතිමය කටයුතු සිදුකිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට අවශ්‍ය ලේඛන නීති අංශය වෙත යොමු කර ඇත. | වැඩිපුර ගෙවීම් ප්‍රතිපූරණය කර ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 880 | ඇප ආඥා පනතට අනුව ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තබා නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන්ගේ ඇප අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා භාණ්ඩාගාරයේ පවත්වාගෙන යනු ලබන ඇප සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීමට ඉල්ලීම් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතුය. |
| (ආ) | 2015 ජුලි 23 දිනැති අංක 07/ 2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 08 vii ඡේදය | එක් එක් මාසයේ දායක මුදල් ඊළඟ මාසයේ 10 වන දිනට පෙර රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ලැබීමට සැලැස්විය යුතු වුවත් 2023 පෙබරවාරි සිට නොවැම්බර් දක්වා දායක මුදල් රු. 874,014ක් එසේ රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට යවා නොතිබුණි. | පිළිතුර පසුව ඉදිරිපත් කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව එක් එක් මාසයේ දායක මුදල් යැවීමට කටයුතු කළ යුතුය. |

## 2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලන්ඩන් දූත මණ්ඩලයට අදාළව තැන්පත් කර තිබූ ස්ටර්ලින් පවුම් 8786 ක් උපලබ්ධි වී නොතිබුණු අතර විදේශ දූත මණ්ඩල 05 ක 2016 සිට 2023 වර්ෂය දක්වා කාලයට අදාළ චෙක්පත් 10ක් හඳුනා නොගත් හර ලෙස පැවතුණි. | උපලබ්ධි වී නොතිබුණු මුදල් ඉදිරියේ නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ මුදල් හා හඳුනා නොගත් හර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විදේශ දූත මණ්ඩල 16ක 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා බැංකු ගිණුමට සෘජුව බැර කරන ලද චෙක්පත් 47ක් හා සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා අමාත්‍යාංශයේ බැංකු ගිණුමට බැර කරන ලද රු.501,006 ක් වූ චෙක්පත් 17ක් හඳුනා ගෙන ගිණුම් ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | සෘජු බැර කිරීම් හඳුනා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය . |
| (ඇ) | වසා දමන ලද විදේශ දූත මණ්ඩල 06ක බැංකු ගිණුම් 08 ක් අක්‍රියව පැවතිණි. | අක්‍රිය බැංකු ගිණුම් වසා දැමීමට කටයුතු කරමින් පවතින බව. | අක්‍රිය බැංකු ගිණුම් කඩිනමින් වසාදැමීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටුනොකිරීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 හා ඊට පෙර වර්ෂයන්හිදී කටාර් රාජ්‍යයෙහි සේවා නියුක්තිය සඳහා ගොස්, අනතුරු හේතුවෙන් මිය ගිය ශ්‍රී ලාංකිකයන් 06 දෙනෙකුගේ වන්දි ලබා ගැනීම් ලිපිගොනු කාල ප්‍රමාදයන් හේතුවෙන් වසා දැමීමට කම්කරු අධිකරණය තීරණය කර තිබුණි. මෙහිදි ඉල්ලුම්කරුවන් නිසි පරිදි ලියවිලි කාලීනව ඉදිරිපත් කර තිබියදී කටාර් තානාපති කාර්යාලයේ නිලධාරීන් නියමිත කාලයේදි වන්දි ලබාගැනීමට වගකිව යුතු | පිළිතුර පසුව ඉදිරිපත් කරනු ලැබේ. | නිලධාරීන්ගේ වගකීම කාර්යක්ෂමව ඉටු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අන්දමින් කටයුතු සිදු නොකිරීම මත වන්දි හා දීමනා ලබාගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි. | | |
| (ආ) | කටාර් රාජ්‍යයෙහි සේවා නියුක්තිය සඳහා විදේශ ගත වූ තැනැත්තෙකු හදිසි අනතුරකින් 2012 සැප්තැම්බර් 10 වන දින මිය ගොස් තිබුණු අතර කොන්සියුලර් අංශය මෙම සිද්ධියට අදාළ වන්දි ඉල්ලීම් තොරතුරු 2013 පෙබරවාරි 06 දින තානාපති කාර්යාලයට ඉදිරිපත් කර තිබුණි. කටාර් ප්‍රාථමික අධිකරණය වන්දි වශයෙන් (Blood money) කටාර් රියාල් 200,000ක් ළඟම ඥාතියාට (NOK) ගෙවන ලෙස නියම කර තිබුණද එම මුදල් නොගෙවීම හේතුවෙන් නඩුව ඉදිරියට පවත්වාගෙන යාම සඳහා බලය පවරමින් නෛතික ලියවිලි 2013 නොවැම්බර් 25 දින තානාපති කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබූ නමුත් එදින සිට වසර 04ක් ගතවන තුරු නඩුවට අදාළ කිසිදු ලියවිල්ලක් ලිපි ගොනුවෙහි ඇතුළත්ව නොතිබුණි. මෙම නඩුව ඉදිරියට පවත්වාගෙන යාමට බලය පවරමින් නැවතත් නෛතික ලියවිලි 2019 පෙබරවාරි 18 දින තානාපති කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබුණද විගණිත දිනය දක්වාම වන්දි අයකර ගැනීමක් කර නොතිබුණි. | පිළිතුර පසුව ඉදිරිපත් කරනු ලැබේ. | නිලධාරීන්ගේ වගකීම කාර්යක්ෂමව ඉටු කළ යුතුය. |
| (ඇ) | කටාර් රාජ්‍යයෙහි සේවා නියුක්තිය සඳහා විදේශ ගත වූ තැනැත්තෙකු 2012 ඔක්තෝම්බර් 21 දින හදිසි අනතුරකින් මිය ගොස් තිබුණු අතර 2012 නොවැම්බර් 06 දින අදාළ වන්දි ඉල්ලීම සිදු කර තිබුණි. වන්දි ඉල්ලීමට අදාළ නඩුව ගොනු කිරීමට අවශ්‍ය නීතිමය ලියවිලි 2013 අගෝස්තු 22 දින තානාපති කාර්යාලයට ඉදිරිපත් කර තිබූ නමුත් වසර 04 ක් ගතවීමෙන් පසු එනම් 2017 නොවැම්බර් 20 දින නීති ආයතනය ලෙස Asma Ali Advocates & Legal Consultants ආයතනය තෝරාගැනීමට අමාත්‍යාංශයේ අනුමැතිය ඉල්ලුම් කර තිබුණි. එසේ වුවද 2018 සැප්තැම්බර් 26 දින මෙම වන්දි මුදල් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා Fahid Al Dosary Law Firm ආයතනය පත්කර තිබුණු අතර | පිළිතුර පසුව ඉදිරිපත් කරනු ලැබේ. | -එම- |

| | | | |
|---|---|---|---|
| | වන්දි ලබා ගැනීම සඳහා මෙම නීති ආයතනයට බලය පැවරීමට අදාළ ලියවිලි, ඥාතියා (NOK) විසින් සම්පූර්ණ කර 2018 නොවැම්බර් 19 දින කටාර් තානාපති කාර්යාලයට ඉදිරිපත් කර තිබුණි. මෙම නඩුව නීති ආයතනයට පැවරීම පිළිබඳ හා නඩුවේ වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය නොවුණි. | | |
| (ඇ) | ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඇතුළත් පහත සඳහන් වන්දි ඉල්ලීම් සම්බන්ධයෙන් කරුණු නිරීක්ෂණය කළද එම නිරීක්ෂණයන් සම්බන්ධයෙන් 2024 මැයි 30 දිනය වන විටත් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.<br>(i) සෞදි අරාබියේ රැකියාවක් සඳහා ගොස් තිබුණු පුද්ගලයෙකු 2012 ඔක්තෝබර් 24 දින අනතුරකට භාජනය වී පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වීම.<br>(ii) කුවේට් රාජ්‍යයෙහි ගෘහ සේවිකාවක් ලෙස රැකියාවක් සඳහා 2009 දෙසැම්බර් 19 දින විදේශ ගතවූ තැනැත්තියක් 2012 ජනවාරි 29 දින මිය යාම.<br>(iii) වර්ෂ 17ක පමණ කාලයක් කුවේට් රාජ්‍යයෙහි ගෘහ සේවයේ යෙදී සිටි තැනැත්තියක් අසනීප වී සුරක්ෂාගාරයට පැමිණීම හා ඒ තුළදී මිය යාම.<br>(iv) ජෙද්දාහීදි 2011 වර්ෂයේදී මරණයට පත්වූ පුද්ගලයෙකු සියදිවි නසා ගැනීමක්ද මරණයට පත් වීමක් ද යන්න සනාථ කර ගැනීම හා වන්දි ලබා ගැනීම. | පිළිතුර පසුව ඉදිරිපත් කරනු ලැබේ. | විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් මහජනතාවට සලසනු ලබන සේවාවන් අතර අ.පො.ස (සා/පෙ.), අ.පො.ස (උ/පෙ.) විභාග සහතික සහ උප්පැන්න, විවාහ, මරණ සහතික කාර්යක්ෂමව සත්‍යාපනය කිරීම පහසු කිරීම සඳහා විද්‍යුත් ලේඛන සහතික කිරීමේ පද්ධතිය (e-DAS) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සහ විභාග දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ කිරීමට සැලසුම් කර තිබුණ ද, එම කාර්යය ක්‍රියාත්මක කර නොතිබුණි. | පිළිතුර පසුව ඉදිරිපත් කරනු ලැබේ. | සැලසුම් කරනු ලබන ක්‍රියාකාරකම් කාලීනව ඉටුකළ කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය විසින් මිලදී ගෙන ඇති කොළඹ 08, ඇල්විටිගල මාවත, 117 වත්ත මහල් නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 17 ක් වෙනුවෙන් හිමිකම් ඔප්පු ලබා ගෙන නොතිබුණි. | ඔප්පු ලබා ගැනීමට අදාළ පත්ඉරු ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙතින් ලබා ගෙන මේ වනවිට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත යොමු කර ඇත. | දේපළවල හිමිකාරීත්වය අමාත්‍යාංශය වෙත පවරා ගත යුතුය. |
| (ආ) | මහා භාණ්ඩාගාරය හරහා මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන තිබූ කල්බදු කාලය අවසන් වාහන 08 අයිතිය පවරාගෙන නොතිබුණි. | බැංකුව භාරයේ ඇති ලියාපදිංචි සහතික අමාත්‍යාංශය වෙත ලබා ගෙන මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කරනු ලැබේ. | වාහනවල අයිතිය පවරා ගත යුතුය. |
| (ඇ) | කැන්බරා මහකොමසාරිස් කාර්යාලයේ 2022 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව 2011 වර්ෂයේදී මිලදී ගෙන තිබූ ජංගම දුරකථන තථ්‍ය ශේෂය 86ක් වුවද ලෙජරය අනුව ශේෂය 117ක් වූයෙන් දුරකථන 31ක හිඟයක් පැවතුණු අතර පැවති දුරකථන 86ද නිශ්කාර්යව පැවතුණි. | පිළිතුර පසුව ඉදිරිපත් කරනු ලැබේ. | හිඟ දුරකථන 31 සඳහා මුදල් රෙගුලාසි 104 ප්‍රකාර කටයුතු කළ යුතු අතර නිශ්කාර්යව පවතින දුරකථන අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විදේශ දූත මණ්ඩල දෙකක 2002 හා 2009 වර්ෂවලට අදාළ අයථා මුදල් පරිහරණය කිරීම් හා මුදල් තැන්පත් නොකිරීම් සහ සිද්ධීන් 02කට අදාළව රු.16,176,674ක පාඩුවක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මුදල් රෙගුලාසි 106 ප්‍රකාර නැති වූ මුදල වහාම පූර්ණය කළ යුතු වුවත් මෙහිදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිතුර පසුව ඉදිරිපත් කරනු ලැබේ. | පරීක්ෂණ සිදු කර අදාළ මුදල් පූර්ණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 කළමනාකරණ දූර්වලතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදේශගත වූ ශ්‍රී ලාංකිකයන් මරණයට පත්වීම, රැකියා අහිමි වීම, අර්ධ හෝ පූර්ණ වශයෙන් ආබාධිත තත්ත්වයට පත්වීම හේතුවෙන් අදාළ පාර්ශවයන්ට ගෙවීම සඳහා වන්දි, රක්ෂණ, සේවය අවසන් කිරීමේ වැටුප් යනාදි වශයෙන් විදේශයන්ගෙන් ලද රු.56,919,349ක් වර්ෂ 01 ක සිට වර්ෂ 03 ක් දක්වා කාලයක සිට අදාළ පුද්ගලයන්ට ගෙවීමට කටයුතු නොකර අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | පිළිතුර පසුව ඉදිරිපත් කරනු ලැබේ. | වන්දි වශයෙන් ලද මුදල් කඩිනමින් ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඕස්ට්‍රේලියාව, ස්වීඩනය හා කෙන්යාව යන රටවල විදේශ දූත මණ්ඩල පවතින ශ්‍රී ලංකා රජයට අයත් ගොඩනැගිලි පැවතියද ඒවා නඩත්තු නොකර සමාලෝචිත වර්ෂයේ නිල නිවාස කුලී වශයෙන් රු. 173,537,875ක් ගෙවා තිබුණි. | පිළිතුර පසුව ඉදිරිපත් කරනු ලැබේ. | වත්කම් ප්‍රශස්ථ අන්දමින් නඩත්තු නොකිරීම සම්බන්ධයෙන් නිලධාරීන් වගකිව යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2019 මාර්තු 06 දින ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝග අංක 14 අනුව ශ්‍රී ලංකාව විදේශයන් සමඟ අත්සන් කළ ගිවිසුම් සම්බන්ධයෙන් වර්තමාන අමාත්‍යාංශ අනුව වර්ගීකරණයක් සිදුකර මෙම ගිවිසුම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන ආකාරය හා වර්තමාන තත්ත්වයද, ගිවිසුම් නීති කඩකිරීම් සිදු වී ඇත්නම් එසේ වීමට හේතුද සඳහන් වාර්තාවක් ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කළයුතු වුවත් එම කාර්යය සිදු කර නොතිබුණි. | පිළිතුර පසුව ඉදිරිපත් කරනු ලැබේ. | ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | මියගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් වර්ෂ 05කට වැඩි කාලයක සිට පැවත එන රු.472,532 ක ණය ශේෂයක් ද, සේවය හැර ගොස් ඇති නිලධාරීන් 15 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,367,830ක ණය ශේෂයකින් වර්ෂ 5ට වැඩි ශේෂය රු.662,946ක් ද, සේවය අවසන් කළ නිලධාරීන් 9 දෙනෙකුගෙන් රු.339,955ක ණය ශේෂයකින් වර්ෂ 05ට වැඩි ශේෂය රු.299,955ක් ද අයවිය යුතුව පැවතුණි. තවද වර්ෂ 05ට වැඩි කාලයක සිට පැවත එන නිලධාරීන් 14 දෙනෙකුගේ රු.1,499,176ක හඳුනාගත නොහැකි ණය ශේෂයක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණ අතර විදේශ දූත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් 21 දෙනෙකුගෙන් රු.1,117,255ක ණය ශේෂවලින් කිසිදු වාරිකයක් සමාලෝචිත වර්ෂයේදී අයකර ගෙන නොතිබුණි. | මියගිය, සේවය හැර ගොස් ඇති, සේවය අවසන් කළ නිලධාරීන්ගේ හා හඳුනා නොගත් ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | හිඟ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 690 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 613 ක් වූයෙන් පුරප්පාඩු තනතුරු 97 ක් හා අතිරික්ත තනතුරු 20 ක් විය. දූත මණ්ඩලවල සියරට පේරුව අනුමත කාර්ය මණ්ඩලය 500 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 356 ක් වූයෙන් පුරප්පාඩු තනතුරු 144 ක් විය. තවද දූත මණ්ඩලවල ස්ථානීය නොවන කාර්ය මණ්ඩලය 548 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 446 ක් වූයෙන් පුරප්පාඩු තනතුරු 102 ක් විය. | කාර්ය මණ්ඩල තොරතුරු ඉදිරිපත් කර ඇත. | අවශ්‍යතාව මත අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හා අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |